**සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම - 2017**

---

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

(අ) ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් සමාගම ස්ථාපිත කිරීමේදී පවරා තිබූ හෙක්ටයාර් 6772 ක් වූ ඉඩම්වලින් රජය මැදිහත්වීම මත කල්බදු වටිනාකම රු.50,586,167 ක් වූ ඉඩම් හෙක්ටයාර් 1750.88 ක් වෙනත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත 1992 වර්ෂයේ සිට පවරා දී තිබූ අතර ඉන් හෙක්ටයාර් 550.88 ක් කුමන ප්‍රදේශවලින් හා කුමන පාර්ශවයන් වෙත නිදහස් කර තිබේද යන්න පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ හා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව නිදහස් කර තිබුණු මෙම ඉඩම්වලට අදාල 2017 දෙසැම්බර් 31 දිනට රු.175,481,744 ක කල්බදු වටිනාකමක් සමාගමෙන් අයවිය යුතු බවට අමාත්‍යාංශය විසින් දන්වා තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.1.1 වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

----------------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය මගින් නියමකරන පරිදි මම පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය හා සීමාකිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

### 2.2 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තිරණවලට අනුකූල නොවීම්

-----------------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ vii වන පරිච්ඡේදය, 3.1 හා 10.2 වගන්තිය | 2007 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා බඳවා ගන්නා ලද නිලධාරීන් 08 දෙනෙකු සඳහා නියමිත වැටුප් වර්ධක ප්‍රමාණයට වඩා වැඩි වැටුප් වර්ධක ප්‍රමාණයක් ලබාදීම හේතුවෙන් 2007 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු.5,547,239 ක අමතර වැටුප් වියදමක් සමාගම දරා තිබුණි. |

| | |
|---|---|
| (ආ) 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව කම්කරු දීමනා, ගැලපුම් දීමනා හා වෛද්‍ය දීමනා ලෙස එකතුව රු.8,395,725 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී සමාගම විසින් ගෙවා තිබුණි. |
| (ඇ) 2015 මැයි 25 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව මාසික ඉන්ධන දීමනාව ප්‍රමාණවත් නොවන විශේෂ අවස්ථා වලදී අමතර ඉන්ධන සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය, ලබාගත යුතු වුවත්, අනුමැතියකින් තොරව නිළධාරීන් දෙදෙනෙකු සඳහා අමතර ඉන්ධන ලීටර් 4,869 ක් වෙනුවෙන් රු.569,623 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. තවද, ඉන්ධන දීමනා හිමිකම් නොමැති සමාගමේ MM වැටුප් කාණ්ඩයේ නිලධාරීන් පස් දෙනෙකු සඳහා ඉන්ධන ලීටර් 12,454 ක් වෙනුවෙන් රු.1,183,160 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුලදී ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.161,797,211 ක අතිරික්තයක් වු අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.126,577,293 ක් වීම හේතුවෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.35,219,918 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. පෙර වර්ෂයට සාපෙක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ආදායම රු.26,946,568 කින් වැඩිවී තිබීම හා අනෙකුත් ආදායම් රු.22,022,520 කින් ඉහළ යෑම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු.208,145,938 ක් ව පැවති අතිරික්තය අඛණ්ඩව පිරිහීමට ලක්ව තිබූ අතර එය සමාලෝචිත වර්ෂයේදී රු.161,797,211 ක් වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු.319,479,160 ක් ව පැවති සමාගමේ දායකත්වය 2016 වර්ෂයේදී රු.275,688,962 ක් දක්වා අඩු වී තිබුණද නැවත සමාලෝචිත වර්ෂයේදී රු.396,092,116 ක් දක්වා වර්ධනය වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ දී ජංගම වත්කම් අනුපාතය 1:7.5 සිට 1:6.8 දක්වා ද ක්ෂණික අනුපාතය 1.67 සිට 1.63 දක්වා ද අඩු වී තිබුණි. සමාගම විසින් දිගුකාලීන ආයෝජන මාර්ග කෙරෙහි යොමුකර ඇති අවධානය අවම මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

(ආ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය සියයට 35 සිට 43 දක්වා වැඩි වී තිබූ අතර, පෙර වර්ෂයට සාපේක්ෂව පොල් විකුණුම් මිල වැඩි වීම හා පොල් නිෂ්පාදනය අඩුවීම හේතුවෙන් විකුණුම් පිරිවැය අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

### 4.1 කාර්යසාධනය

----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල පොල් ඵලදාව පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 36 කින් අඩු වී තිබූ අතර ප්‍රමාණවත් පරිදි වාරිජල පද්ධති ඇති නොකිරීම හා නියඟයට මුහුණ දීම සඳහා කෘෂිකාර්මික උපක්‍රම අඛණ්ඩව ක්‍රියාත්මක නොකිරීම පොල් ඵලදාව අඩු වීමට හේතු වී තිබුණි.

(ආ) පොල් පර්යේෂණ ආයතනයේ සම්මතයන්ට අනුව පොල් ගසක වාර්ෂික සාමාන්‍ය ඵලදාව ගෙඩි 72 ක් පමණ විය යුතු වුවත් සමාගම විසින් පාලනය කරන වතු 08 හි එම අගය පොල්ගෙඩි 28-42 අතර පරාසයක පැවතුණි. සමාගම විසින් පාංශු පරීක්ෂාව සිදු කර ඒ අනුව පොහොර හා රසායනික ද්‍රව්‍ය නොයෙදීම හා වාරි පද්ධති ඇති නොකිරීම ඵලදාව අඩුවීමට බලපා තිබුණි.

(ඇ) සමාගම විසින් පාලනය කරන වතු 08 හි මුළු ඵල දරන පොල් ගස් ප්‍රමාණයෙන් සියයට 4-9 ත් අතර ප්‍රමාණයක උස ගස් පවතින අතර, සමාගම විසින් මාසිකව පොල් අස්වනු නෙලීම සිදු කලද, මුළු පොල් ඵලදාවෙන් සියයට 22 ක් එනම් පොල් ගෙඩි 2,386,831 ක් පමණ වැටුණු පොල් විය. ඒ සඳහා මාසිකව පොල් අස්වනු නෙලීම නියමිත කාල පරාසයන් තුල සිදු නොකිරීම හා උස ගස්වල පොල් කැඩීම නියමිත පරිදි සිදු නොකිරීම වැටුණු පොල් ඵලදාව ඉහළ යාමට හේතු වී තිබුණි.

(ඈ) සමාගම පාලනය කරන වතු 08 මගින් පරිනත ලෙස හඳුනාගෙන තිබූ 354,715 ක පොල් ගස් ප්‍රමාණයෙන්, ගස් 58,287 ක් එනම් සියයට 16 ක් පමණ ඵල රහිත පොල් ගස් වන අතර අදාල ගස් ඉවත්කර නැවත වගා කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ඉ) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ දත්තයන්ට අනුව සමාලෝචිත වර්ෂයේදී හෙක්ටයාරයක රබර් කිරි ඵලදාව කිලෝග්‍රෑම් 809 ක් වුවත් සමාගම විසින් පාලනය කරනු ලබන රබර් හෙක්ටයාරයකින් ලබා ගෙන ඇති ඵලදාව කිලෝග්‍රෑම් 689 ක් පමණක් විය. ඒ අනුව සමාගම පාලනය කරනු ලබන හෙක්ටයාර් 173.47 ක ඇති රබර් වගාවේ ඵලායි ජීව කාලය ඉක්මවූ රබර් ගස් ඉවත්කර නැවත වගා කිරීමට කටයුතු කර නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කටුගම්පල වතුයායට අයත් කිතුල්කැලේ බෙදුමේ හෙක්ටයාර් 11.49 ක් පුරා විහිදී තිබූ කලු ගල, සමාගමේ වාර්තා අනුව 2005 වර්ෂයේ සිට අනවසර පුද්ගලයින් විසින් කැණීම් කර තිබූ අතර 2008 වර්ෂය වන විට අනවසර පුද්ගලයින් 06 දෙනෙකු හා බලපත්‍රලාභි පුද්ගලයින් 3 දෙනෙකු කැනීම් කටයුතු සිදුකර තිබුණි. ඒ පිළිබඳ සමාගම කිසිදු නිතීමය පියවරක් ගෙන නොතිබුණු අතර සමාගම විසින් මෙම කළුගල බදු දීම සඳහා 2017 අගෝස්තු මාසයේදී මිල ගණන් කැඳවා තිබුණද, අදාල ටෙන්ඩරය ප්‍රදානය කිරීම, 2018 ඔක්තෝබර් 16 දින වන විටත්

සිදුකර නොතිබූ අතර බාහිර පාර්ශවයන් විසින් කැණීම් කටයුතු තවදුරටත් සිදුකරමින් පැවතුණි.

(ආ) සමාගමේ කටුගම්පල වතුයායට අයත් එස්මෝෆිල්ඩ් බෙදුමෙහි හෙක්ටයාර් 1.34 ක භූමියක ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ ඇස්තමේන්තුවට අනුව රු.2,492,000 ක් වැයකර වැවක් ඉදිකිරීම සඳහා තීරණය කර තිබුණු අතර වැව හැරීමෙන් ලැබෙන පස් වැව් බැම්ම ඉදිකිරීමට යෙදීමෙන් පසු ඉතිරි වන පස් කියුබ් ප්‍රමාණය 530 ක් විය යුතු බවට ඇස්තමේන්තු කර තිබුණි. එහෙත් වැව් බැම්ම ඉදිකිරීමකින් තොරව සමාගම විසින් පස් කියුබ් 1,000 ක් අලෙවි කිරීමට ටෙන්ඩර් කැඳවා තිබුණි. ඒ අනුව සැලසුම් කළ පරිදි වැව ඉදිකර නොමැතිව පස් අලෙවි කර තිබුණු බව නිරීක්ෂණය විය.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගම සතු හෙක්ටයාර් 203.46 ක් වූ කුඹුරු ඉඩම් පැවතියද, මෙම භූමිය වර්තමානය වන විට අඳගොවීන් අත්පත්කරගෙන ඇති අතර, මෙම ඉඩම් නැවත සමාගමේ පරිපාලනයට ලබාගැනීමට හෝ බදු පදනම මත ලබා දීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා කජු සංස්ථාවේ දත්තයන්ට අනුව කජු ගසක වාර්ෂික සාමාන්‍ය අස්වැන්න කිලෝග්‍රෑම් 10 ක් පමණ වන අතර සමාගම විසින් නඩත්තු කරනු ලබන කජු ගස් 13,456 කින් යුතු පරිනත වගාවෙන් සමාලෝචිත වර්ෂයේ දී ලබා ගෙන තිබූ අස්වැන්න කිලෝග්‍රෑම් 22,943 ක් පමණක් විය. ඒ අනුව ලබා ගත යුතු සාමාන්‍ය අස්වැන්නෙන් සියයට 17 ක පමණ අස්වැන්නක් සමාලෝචිත වර්ෂයේදී ලබාගෙන තිබුණි. වතු කළමණාකරණය විසින් වගාවන් සඳහා කප්පාදුකිරීම් යනාදී කටයුතු නිසි කාලයේදී සිදු නොකිරීම හේතුවෙන් ඉහළ කජු එලදාවක් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂයේ නිකුත්කළ තාක්ෂණික ප්‍රකාශනය අනුව පරිනත ගම්මිරිස් වැලක සාමාන්‍ය අස්වැන්න වසරකට වියළි ගම්මිරිස් කිලෝ ග්‍රෑම් 1-2.5 පරාසයක විය යුතු වුවත් සමාගම පාලනය කරනු ලබන වතු තුනක පවතින හෙක්ටයාර් 34.32 කින් යුතු පරිනත ගම්මිරිස් වගාවෙහි පැල 12,013 ක් පමණ පැවතියද, එයින් ලබාගෙන තිබූ වියළි ගම්මිරිස් එලදාව කිලෝග්‍රෑම් 4,853 ක් එනම් ගම්මිරිස් වැලකින් වියළි ගම්මිරිස් කිලෝ ග්‍රෑම් 0.41 පමණක් විය. ප්‍රමාණවත් පරිදි කෘෂිකාර්මික ක්‍රම උපායන් අනුගමනය නොකිරීම හා කෘෂි උපදේශන සේවා ලබා නොගැනීම මේ සඳහා හේතු වී තිබුණි.

## 4.4 ඌන උපයෝජිත වත්කම්

---------------------------

අත්තනගල්ල වතුයායේ දම්මුල්ලහේන කොටසේ රු.12,078,708 ක වියදමක් දරා ඉදිකර තිබූ රබර් කර්මාන්තශාලාවේ මෙහෙයුම් කටයුතු 2016 වර්ෂයේදී ආරම්භ කර තිබූ අතර, කර්මාන්තශාලාවේ යන්ත්‍ර වල දිනක නිෂ්පාදන ධාරිතාව රබර් කිරි කිලෝ ග්‍රෑම් 1000 ක් වුවද, සමාලෝචිත වර්ෂයේදී නිෂ්පාදනය සඳහා යොදාගෙන තිබූ රබර් කිරි ප්‍රමාණය කිලෝග්‍රෑම් 50,357 ක් පමණක් විය. ඒ අනුව කර්මාන්ත ශාලාවේ සම්මත නිෂ්පාදන ධාරිතාවයෙන් සියයට 14 ක් පමණක් උපයෝජනය කර තිබුණි. මේ සඳහා සමාගම විසින් රබර් කිරි එලදාව වැඩි කර ගැනීමට හා බාහිර පාර්ශවයන්ගෙන් රබර් කිරි මිලදී ගැනීම මඟින් නිෂ්පාදන ප්‍රමාණය වැඩිකර ගැනීමට කටයුතු කර නොතිබීම හේතු වී තිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

සමාගමේ වතු මෙහෙයුම් කටයුතු සඳහා ඍජුව දායක වන ස්ථානභාර නිලධාරී තනතුරු 19 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පුරප්පාඩුව පැවති අතර, මේ හේතුවෙන් වතුයායන්හි දෛනික මෙහෙයුම් කටයුතු කාර්යයක්ෂමව හා ප්‍රමාදයකින් තොරව සිදු කිරීමට නොහැකි වී තිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සමාගමේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමුකරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | අයවැය ලේඛනමය පාලනය | අයවැය මගින් නිෂ්පාදිත ඉලක්ක ස්ථාපිත කර තිබුණද ඒවා සපුරාගැනීමේ ක්‍රියාවලිය දූර්වල මට්ටමක පැවතීම. |
| (ආ) | ණයගැති පාලනය | දිගුකාලීන ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ඇ) | කාර්ය මණ්ඩල පරිපාලනය | සමාගමෙහි සේවය කරනු ලබන කම්කරුවන් ප්‍රමාණය අඛණ්ඩව අඩු වී තිබීම හේතුවෙන් කම්කරුවන් ප්‍රමාණවත් ලෙස නොමැති වීමේ අවධානමක් පවතී. |
| (ඈ) | මෙහෙයුම් පාලනය | පොල් ගසකින් ලැබෙන අස්වැන්න අඩුවීම, විද්‍යාත්මක පදනමකින් පොල් පොහොර නොයෙදීම සහ නිසි නඩත්තු හා පාලන ක්‍රම අනුගමනය නොකිරීම හා ප්‍රමාණවත් ජල සැපයුම් පද්ධතියක් නොතිබීම හේතුවෙන් වගා කළ පැල විනාශ වී යෑම. |